# මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
# නාගරික සංවර්ධන අධිකාරිය.
## ටෙන්ඩර් දැන්වීමයි

පොළොන්නරුව සංචාරක තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පිහිටි කඩ කාමර එකොළහක් (11) අවුරුදු 30 ක කාලයකට බදුදීම සඳහා ටෙන්ඩරය

01. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු සුබිත පුරවර නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව නගරයේ ඉදිකළ සංචාරක තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පිහිටි කඩ කාමර එකොළහක් (11) වසර 30 (තිහ) ක කාලයකට බදුදීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ආදායම් ටෙන්ඩර් මණ්ඩලය (අනු) විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

02. එක් ටෙන්ඩර්පතක් වලංගු වන්නේ එක් කඩ කාමරයක් බදුගැනීමට පමණි. අයදුම්කරුවෙකු එක කඩ කාමරයකට වඩා අයදුම් කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, එක් එක් කඩ කාමරය සඳහා වෙන වෙනම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය.

03. මිළ ගණන් භාරගැනීම 2017 නොවැම්බර් මස 30 වන දින ප.ව. 1.30 ට අවසන්වේ. මුද්‍රා තබන ලද මිළ ගණන් නියමිත වේලාවට පෙර සභාපති, අදායම් ටෙන්ඩර් මණ්ඩලය (අනු), 06 වන මහළ, නාගරික සංවර්ධන අධිකාරිය, සෙත්සිරිපාය, බත්තරමුල්ල. ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ බත්තරමුල්ල, සෙත්සිරිපාය, 06 වන මහළ නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලිපියේ ඉහළ වම් කෙළවරේ පොළොන්නරුව සංචාරක තොරතුරු මණ්ඩලය කඩකාමර ලබාගැනීම සඳහා ටෙන්ඩරය ලෙස සටහන් කළ යුතුය.

04. සෑම ටෙන්ඩරයක්ම ආපසු ගෙවනු ලබන රු. 10,000/- ක ටෙන්ඩර් තැන්පතුවක් සමඟ ඉදිරිපත් කළ යුතු අතර, කඩ කාමර සඳහා අපේක්ෂිත පදනම් මුදල සහ මාසික කුලිය පහත පරිදි වේ. ඉදිරිපත් කළ ඉහළම පදනම් මුදල මත ටෙන්ඩරය ප්‍රදානය කිරීමට කටයුතු කරනු ලැබේ.

| කඩකාමර පිහිටි මහළ | කඩ කාමර අංක | වර්ග අඩි ප්‍රමාණය (එක් ඒකකයක) | එක් ඒකකයක් සඳහා පදනම් මිළ (රු.) | එක් ඒකකයක් සඳහා මාසික කුලිය (රු.) |
|---|---|---|---|---|
| බිම් මහළ | 1 | 840 | 1,850,000.00 | 10,000.00 |
| | 2 | 840 | 1,850,000.00 | 10,000.00 |
| | 3 | 840 | 1,850,000.00 | 10,000.00 |
| | 4 | 840 | 1,850,000.00 | 10,000.00 |
| | 5 | 840 | 1,850,000.00 | 10,000.00 |
| පළමු මහළ | 6 | 1695 | 3,000,000.00 | 19,750.00 |
| | 7 | 682 | 1,200,000.00 | 6,500.00 |
| | 8 | 718 | 1,350,000.00 | 7,750.00 |
| | 9 | 718 | 1,350,000.00 | 7,750.00 |
| | 10 | 718 | 1,350,000.00 | 7,750.00 |
| දෙවන මහළ | 11 | 636 | 900,000.00 | 5,400 |

ඉහත පදනම් මිළට හා මාසික කුලියට රජයේ අදාළ බදු මුදල් (වැට් 15 % ක් හා ජා.ගො.බ. 2.04 % ද) ගෙවිය යුතුය.

සභාපති,
ආදායම් ටෙන්ඩර් මණ්ඩලය
නාගරික සංවර්ධන අධිකාරිය.

2017 නොවැම්බර් මස 16 වන දින.